# කාර්යය පත්‍රිකාව 14

**1. පන්තිය - 6 ශ්‍රේණිය　　　විෂයය - ගණිතය　　　අදාල සතිය - 11 - 1 සතිය**

**2. පාඩම හෝ ඒකකය - අනුපාත**

**3. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල**

I. රාශි දෙකක් අතර අනුපාතය යන සංකල්පය විස්තර කරයි.
II. අනුපාතයකට තුල්‍ය වූ අනුපාත සොයයි.
III. අනුපාතයක් සරලම ආකාරයෙන් ලියයි.

**4. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්**

I. ඔබේ නිවසේදී විවිධ අවස්ථාවල ද්‍රව්‍ය භාවිතා වන ආකාර සලකමු. ඒවා ඇසුරින් දී ඇති වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න. එම තොරතුරු හා පෙළපොත භාවිතයෙන් අනුපාත හඳුනාගන්න.

| මිශ්‍රණය | භාවිතා කල ද්‍රව්‍යයන් | අනුපාතය | අනුපාතය කියවන ආකාරය |
|---|---|---|---|
| කිරි තේ | කිරිපිටි තේ හැදි 3　　සීනි තේ හැදි 2 | 3 : 2 | තුන අනු දෙක |
| සිමෙන්ති බදාම | වැලි තාච්චි .......　　සිමෙන්ති තාච්චි ....... | .......... | ............................. |
| කේක් සෑදීම | පිටි ග්‍රෑම් .........　　සීනි ග්‍රෑම් ............. | ........... | ............................. |
| | | | |
| | | | |

II. Enenapiyasa, e-thaksalawa, DP Education, පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක මඟින් අනුපාත පාඩමට අදාල ඉගැන්වීම් ලබාගෙන ඉගෙනගන්න.
III. පාඩමට අදාල වන 21.1, 21.2 අභ්‍යාස සම්පූර්ණ කරන්න.

**5. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්,website හා ඉගෙනුම් ආධාරක**

I. https://enenapiyasa.lk/ 6 ශ්‍රේණිය ගණිතයට අදාල සාමාන්‍ය පාඩම් සබැඳුම්
II. https://www.e-thaksalawa.moe.gov.lk 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්
III. DP Education හි සබැඳුම් https://www.youtube.com/watch?v=wd1M5JKzVLw
IV. Youtube සබැඳුම් - https://www.youtube.com/watch?v=EnaOgxvykuo&t=5s
https://www.youtube.com/watch?v=ImJBuAgNW6Q

**6. ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය**

1) පහත දැක්වෙන එක් එක් අනුපාතය සංකේත ඇසුරින් දක්වන්න.

I. දෙක අනු පහ
II. අට අනු තුන
III. දහය අනු හත
IV. පහ අනු එක

2) මා ළඟ රුපියල් 13 ක් ද නංගි ළඟ රුපියල් 18 ක් ද ඇත. මා ළඟ හා නංගී ළඟ ඇති මුදල් අතර අනුපාතය සොයන්න.

3) හර්ෂණී හා චමිලා ළඟ ඇති පාට පැන්සල් අතර අනුපාතය 2 : 3 වේ. හර්ෂණී ළඟ පාට පැන්සල් 6 ක් ඇත්නම් චමිලා ළඟ ඇති පාට පැන්සල් ගණන සොයන්න.

4) පහත දැක්වෙන එක් එක් අනුපාතයට තුල්‍ය අනුපාතයක් බැගින් ලියන්න.

I. 3 : 7
II. 20 : 30
III. 2 : 8
IV. 15 : 18
V. 4 : 12
VI. 25 : 15

5) පහත සඳහන් එක් එක් අනුපාතය සරලම ආකාරයෙන් ලියන්න.

I. 5 : 15
II. 8 : 20
III. 50 : 70
IV. 12 : 15
V. 10 : 150
VI. 18 : 36

නිලධාරියාගේ නම:- ආර්. යූ. අයි. ධර්මදාස පාසල:- කෑ/මාව/ බෝධිරාජ ක.වි.